*සැ. යු.* - 2015.07.24 වැනි දින පළ වූ අංක 1,925 දරන ගැසට් පත්‍රයේ I V (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,926 - 2015 ජූලි මස 30 වැනි බ්‍රහස්පතින්දා - 2015.07.30**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 1290 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | 1291 |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 1292 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 1298 |

*සැ. යු.*- ත්‍රිකුණාමලය, පන්කුලම, මොරවැව දකුණු සිරිගජබා ගල්ලෙන් රජමහා විහාරස්ථ සංවර්ධන සභාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2015 ජූනි මස 12 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 අගෝස්තු මස 21 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 අගෝස්තු මස 07 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# බඩු බාහිරාදිය විකිණීම්

## මහෙස්ත්‍රාත් අධිකරණය - පානදුර

### අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබූ භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

01. පානදුර මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළව රාජසන්තක කරන ලද, හිමිකම් නොකියන ලද සහ නඩු අංක සොයාගත නොහැකි පහත සඳහන් භාණ්ඩ වර්ෂ 2015.08.22 වැනි දින පෙ. ව. 10.00 ට මෙම අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. මෙම වෙන්දේසි කරනු ලබන කිසියම් භාණ්ඩයක් පිළිඳව අයිතිවාසිකම් කියන්නෙකු වේ නම් ඒ පිළිබඳව වෙන්දේසිය පවත්වනු ලබන දින. පෙ. ව. 9.00 සිට පෙ. ව. 10.00 දක්වා ස්වකීය අයිතිවාසිකම් ඉදිරිපත් කළ යුතු ය.

03. වෙන්දේසිය ආරම්භ කිරීමට පැය 1/2කට පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත භාණ්ඩ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය පරිදි මහජනයාට පරීක්ෂා කර බැලිය හැකි වේ.

04. වෙන්දේසියෙන් මිලදී ගන්නා භාණ්ඩ සඳහා ඒ අවස්ථාවේ දීම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කරගත යුතු අතර, සියලුම ගෙවීම් මුදල් වලින් පමණක් කළ යුතු ය. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවේ දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කිරීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් භාණ්ඩ ඉල්ලීමට පැමිණෙන අය තම ජාතික හැඳුනුම්පත ද ඉදිරිපත් කළ යුතු ය.

06. වෙන්දේසිය සම්බන්ධයෙන් පැමිණිලි කිසිවක් තිබේ නම් වෙන්දේසිය පවත්වන අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතු අතර, වෙන්දේසියෙන් පසුව ලැබෙන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ.

රුචිර වැලිවත්ත,
මහෙස්ත්‍රාත්/අතිරේක දිසා විනිසුරු,
මහෙස්ත්‍රාත් අධිකරණය,
පානදුර.

2015 ජූලි මස 14 වැනි දින,
පානදුර මහෙස්ත්‍රාත් අධිකරණයේදී ය.

### පානදුර මහෙස්ත්‍රාත් අධිකරණයේ 2015.08.22 දිනට යෝජිත වෙන්දේසිය

| | | |
|---|---|---|
| 01. | 80906 | ජංගම දුරකථනය |
| 02. | 69516 | ජංගම දුරකථනය |
| 03. | 95572 | ජංගම දුරකථනය |
| 04. | 00322 | ජංගම දුරකථනය |
| 05. | 80869 | ජංගම දුරකථනය |
| 06. | 87434 | ජංගම දුරකථනය |
| 07. | 87738 | ජංගම දුරකථනය |
| 08. | 87777 | ජංගම දුරකථනය |
| 09. | 94265 | ජංගම දුරකථනය |
| 10. | 94265 | ජංගම දුරකථනය |
| 11. | 12120 | ජංගම දුරකථනය |
| 12. | 95419 | ජංගම දුරකථනය |
| 13. | 95419 | ජංගම දුරකථනය |
| 14. | 10420 | ජංගම දුරකථනය |
| 15. | 84026 | ජංගම දුරකථනය |
| 16. | 84026 | ජංගම දුරකථනය |
| 17. | 84026 | ජංගම දුරකථනය |
| 18. | 84026 | ජංගම දුරකථනය |
| 19. | 84728 | ජංගම දුරකථනය |
| 20. | 82413 | ජංගම දුරකථනය |
| 21. | 82995 | ජංගම දුරකථනය |
| 22. | 79773 | ජංගම දුරකථනය |
| 23. | 78725 | ජංගම දුරකථනය |
| 24. | 96347 | ජංගම දුරකථනය |
| 25. | 94887 | ජංගම දුරකථනය |
| 26. | 67490 | ජංගම දුරකථනය |
| 27. | 56319 | ජංගම දුරකථනය |
| 28. | 10912 | ජංගම දුරකථනය |
| 29. | 11637 | ජංගම දුරකථනය |
| 30. | 11980 | ජංගම දුරකථනය |
| 31. | 10157 | ජංගම දුරකථනය |
| 32. | 00087 | ජංගම දුරකථනය |
| 33. | 00087 | ජංගම දුරකථනය |
| 34. | 07601 | ජංගම දුරකථනය |
| 35. | 06988 | ජංගම දුරකථනය |
| 36. | 06116 | ජංගම දුරකථනය |
| 37. | 68335 | ජංගම දුරකථනය |
| 38. | 70533 | ජංගම දුරකථනය |
| 39. | 75264 | ජංගම දුරකථනය |
| 40. | 85369 | ජංගම දුරකථනය |
| 41. | 02278 | ජංගම දුරකථනය |
| 42. | 95162 | ජංගම දුරකථනය |
| 43. | 99885 | ජංගම දුරකථනය |
| 44. | 99397 | ජංගම දුරකථනය |
| 45. | 99572 | ජංගම දුරකථනය |
| 46. | 92645 | ජංගම දුරකථනය |
| 47. | 98013 | ජංගම දුරකථනය |
| 48. | 08964 | ජංගම දුරකථනය |
| 49. | 51068 | ජංගම දුරකථනය |
| 50. | 86892 | ජංගම දුරකථනය |
| 51. | 89100 | ජංගම දුරකථනය |
| 52. | 91671 | ජංගම දුරකථනය |
| 53. | 85222 | ජංගම දුරකථනය |
| 54. | 85222 | ජංගම දුරකථනය |
| 55. | 85222 | ජංගම දුරකථනය |
| 56. | 84787 | ජංගම දුරකථනය |
| 57. | 98513 | ජංගම දුරකථනය |
| 58. | 82413 | සෙරෙප්පු ජෝඩුවක් |
| 59. | 85369 | කැමරාවක් |
| 60. | 93513 | පිත්තල පහනක කොටසක් |
| 61. | 09503 | නයිලෝන් කඹයක් |

| | | |
|---|---|---|
| 62. | 09503 | විදුලි පන්දමක් |
| 63. | 09503 | සෙරෙප්පු ජෝඩුවක් |
| 64. | 26112 | ළමා සෙරෙප්පු ජෝඩුවක් |
| 65. | අංක රහිත | මෝල්ගසක් |
| 66. | 93939 | අබලන් වූ ගේට්ටු පියනක් |
| 67. | 83132 | ඉමිටේෂන් ආභරණ කිහිපයක් |
| 68. | 15877 | ඉමිටේෂන් ආභරණ කිහිපයක් |
| 69. | අංක රහිත | දිරාපත් වූ ජනෙල් උළුවහු 05ක් |
| 70. | 10443 | දිරාපත් වූ කොස් කොට 03ක් |
| 71. | 26492 | ප්ලාස්ටික් ජල කරාමයක් |
| 72. | 87522 | කටර් අඬුවක් |
| 73. | 87522 | ඇන්ටනාවක් |
| 74. | 94263 | ඇක්සල් ක්‍රාෆ්ට් 01ක් |
| 75. | 97511 | ඔයිල් කෑට 06ක් |
| 76. | 07615 | මෝටර් බද කොටස් 08ක් |
| 77. | 05861 | වවුල් සරනේරු 07, හුලං කොකු 07, සොයිබ 02 |
| 78. | 29279 | හිස් මුදල් පසුම්බියක් |
| 79. | 24661 | ගෑස් ලිප |
| 80. | 99550 | ගෑස් සිලින්ඩරය |
| 81. | 07449 | ඉලෙක්ට්‍රොනික් තරාදිය |
| 82. | 15903 | ඉලෙක්ට්‍රොනික් තරාදිය |
| 83. | 21634 | ඉලෙක්ට්‍රොනික් තරාදිය |
| 84. | 09403 | ඉලෙක්ට්‍රොනික් තරාදිය |
| 85. | 14732 | දුණු තරාදිය |
| 86. | 14729 | දුණු තරාදිය |
| 87. | 14722 | දුණු තරාදිය |
| 88. | 14725 | දුණු තරාදිය |
| 89. | 14724 | දුණු තරාදිය |
| 90. | 14728 | දුණු තරාදිය |
| 91. | 14727 | දුණු තරාදිය |
| 92. | 14726 | දුණු තරාදිය |
| 93. | 14731 | දුණු තරාදිය |
| 94. | 14723 | දුණු තරාදිය |
| 95. | 14730 | දුණු තරාදිය |
| 96. | 10422 | තරාදිය |
| 97. | 08600 | අබලන් වූ පාපැදිය |
| 98. | 09503 | අබලන් වූ පාපැදිය |
| 99. | 87522 | අබලන් වූ පාපැදිය |
| 100. | 77514 | මඩ්ගාඩ් රහිත අබලන් වූ පාපැදිය |
| 101. | 97511 | අබලන් වූ පාපැදිය |
| 102. | 96627 | අබලන් වූ පාපැදිය |
| 103. | 92092 | අබලන් වූ පාපැදිය |
| 104. | 94259 | අබලන් වූ පාපැදිය |
| 105. | අංක රහිත | අබලන් වූ පාපැදිය |
| 106. | අංක රහිත | අබලන් වූ පාපැදිය |
| 107. | අංක රහිත | අබලන් වූ පාපැදිය |
| 108. | අංක රහිත | අබලන් වූ පාපැදිය |
| 109. | අංක රහිත | අබලන් වූ පාපැදිය |
| 110. | අංක රහිත | අබලන් වූ පාපැදිය |
| 111. | අංක රහිත | අබලන් වූ පාපැදිය |
| 112. | 29213 | ප්ලාස්ටික් බේසමක් |
| 113. | 29213 | වීල් බැරෝ එකක් |
| 114. | අංක රහිත | සාය 07, හැට්ට 02 |
| 115. | 13048 | යකඩ පොල්ලක් |
| 116. | 12466 | කම්බි පාර්සලයක් |
| 117. | 09881 | ඩ්‍රිල් මැෂින් එකක් |
| 118. | 61058 | සබ්වුපර් 01, ස්පීකර් 02, දුරස්ථ පාලක 01 |
| 119. | 96853 | ලෑල්ලක් |
| 120. | 07627 | සුනඛයන්ගේ කරේ බඳින පටි |
| 121. | 09009 | රිම් එක සහිත ටයරයක් |
| 122. | 87399 | අබලන් යතුරු පැදියක් (අබලි) |
| 123. | 20899 | WP - MS - 8974 දරන යතුරු පැදිය |
| 124. | AR1119/13 | රූපවාහිණිය සහ දුරස්ථ පාලකය |
| 125. | අංක රහිත | පැදුරක් |
| 126. | 08909 | පැදුරක් |
| 127. | අංක රහිත | හිස් ප්ලාස්ටික් කෑන් (ලොකු) |
| 128. | අංක රහිත | හිස් මැටි මුට්ටි |
| 129. | අංක රහිත | හිස් ප්ලාස්ටික් කෑන් (කුඩා) |
| 130. | අංක රහිත | හිස් වීදුරු බෝතල්. |

07-1516

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

**නාරම්මල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සඳහා රා තැබෑරුම් රේන්ද විකිණීම - 2016 වර්ෂය**

2016 ජනවාරි මස 01 වැනි දින සිට 2016 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලය තුළ පහත සඳහන් උපලේඛනයෙහි දක්වා ඇති රා තැබෑරුමේ පැසුණු රා සිල්ලරට විකිණීමේ සම්පූර්ණ වරප්‍රසාදය මිළ දී ගැනීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 207 දරන ගැසට් පත්‍රයේ සුරාබදු කොමසාරිස්වරයා විසින් පළ කරන ලද රා විකිණීමේ කොන්දේසිවලට යටත්ව 2015 සැප්තැම්බර් මස 01 වැනි දින පෙ.ව. 10.30 දක්වා නාරම්මල ප්‍රාදේශීය ලේකම් විසින් ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. රා රේන්ද මිළ දී ගැනීම සඳහා ඉදිරිපත්වන අය ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක් නිසි පරිදි සම්පූර්ණ කර මෙහි පහත දැක්වෙන උපලේඛනයෙන් නියම කොට ඇති ටෙන්ඩර් තැන්පත් මුදල මෙම කාර්යාලයට හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට ගෙවා ලබා ගන්නා ලද කුවිතාන්සිය ද, ඉහත දක්වා ඇති ගැසට් නිවේදනයේ වන රා විකිණීමේ කොන්දේසිවල දැක්වෙන පරිදි ලබාගත් වත්කම් සහතිකයක් ද සහිතව කවරයක බහා එයට මුද්‍රා තබා එහි මුදුනේ වම් කෙළවරේ තමන් ටෙන්ඩර් කරන තැබෑරුමේ අංකය සහ නම

ද පැහැදිලිව ලියා උපලේඛනයේ දැක්වෙන අවසාන වේලාවට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් හෝ මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මේ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් නාරම්මල ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන්නට සැලැස්විය හැක.

03. ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර්පත් සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර් පත්‍රවල කරනු ලබන සෑම වෙනස් කිරීමක් සඳහා ම ටෙන්ඩර්කරුගේ සම්පූර්ණ අත්සන යෙදීමෙන් සනාථ කළ යුතු ය. එසේ නොවන ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය වන 2015 සැප්තැම්බර් මස 01 වැනි දින පෙ.ව. 10.30 ට සියලුම ටෙන්ඩර්කරුවන් මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. කිසිම කරුණු දැක්වීමක් නොකොට ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ ටෙන්ඩර් පත්‍රිකා සියල්ල ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය නාරම්මල ප්‍රාදේශීය ලේකම් සතු වේ.

06. තනි වරප්‍රසාදය මිලදීගත් තැනැත්තා යැයි ප්‍රකාශයට පත් කිරීමෙන් පසු සාර්ථක ටෙන්ඩර්කරු විසින් එසේ ප්‍රකාශ කළ දින ප.ව. 3.00 ට පෙර නාරම්මල ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන මුදලක් ආරක්ෂිත ඇප තැන්පත් වශයෙන් ගෙවා විකුණුම් කොන්දේසිවලට අත්සන් කළ යුතු ය.

07. 2016 වර්ෂය සඳහා දැනට රා තැබෑරුම ඇති ස්ථානය ලබා දීමට සහතික වනු නොලැබේ. දැනට රා තැබෑරුම පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල 2016 වර්ෂය සඳහා නොලැබෙන්නේ නම් ඒ වෙනුවට තෝරාගත් අලුත් ස්ථානයේ යෝග්‍යතාවය පිළිබඳව, ටෙන්ඩරය ප්‍රදානය කළ දින සිට දින 30 ක් ඇතුළත සාර්ථක ටෙන්ඩර්කරු විසින් ඒ සඳහා නාරම්මල ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය ද ලබාගත යුතු ය.

08. 2015 සැප්තැම්බර් මස 01 වැනි දින රේන්දය විකිණීමෙහිලා සතුටුදායක ඉල්ලීම් නොතිබුණහොත් 2015 ඔක්තෝබර් මස 24 වැනි දින පෙ.ව. 10.30 ට නැවත රේන්ද විකිණීම මේ ස්ථානයේ දී පවත්වනු ලැබේ.

09. වැඩි විස්තර අවශ්‍ය නම් මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකිය.

එම්. ඒ. ආර්. සුදර්ශණී,
ප්‍රාදේශීය ලේකම්,
නාරම්මල.

2015 ජූලි මස 07 වැනි දින,
නාරම්මල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *අනුක්‍රමික අංකය* | *කොට්ඨාසය* | *ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු.* | *රා තැබෑරුම විවෘත කර තබන වේලාවන්* |
|---|---|---|---|---|
| 01 | නාරම්මල | 2015.09.01 පෙ.ව. 10.30 ට පෙර | 1,000 | පෙ.ව. 11.00 - ප.ව. 2.00 දක්වා<br>ප.ව. 5.00 - රාත්‍රී 8.00 දක්වා |

07-1271

# රජයේ නොවන දැන්වීම්

**දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බව මෙයින් දන්වමු.

| *සමාගමේ නම* | *ලියාපදිංචි අංකය* | *ලියාපදිංචි කළ දිනය* | *ලියාපදිංචි කාර්යාලීය ලිපිනය* |
|---|---|---|---|
| 1. ග්‍රීන්ත්‍රු ගෘෘප් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 106872 | 2015.07.09 | අංක 951, මරදාන පාර, කොළඹ 08 |

ෆයිනෑන්ෂියල් ඇන්ඩ් බිස්නස් ඇසෝසියේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

07-1529

### සමාගමේ නම වෙනස් කිරීම පිළිබඳව කරනු ලබන ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වගන්තිය ප්‍රකාරව පහත නම සඳහන් සමාගමේ නම වෙනස් කළ බවට කරනු ලබන නිවේදනයයි

කලින් තිබූ නම : කමලාම්බිහායි රයිස් මිල් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පීවී 75281
සමාගමේ ලිපිනය : 46, කේ සිරිල් සී පෙරේරා මාවත, කොළඹ 13
නම වෙනස් කළ දිනය : 2015 මැයි 20 වැනි දින
සමාගමේ නව නාමය : කමලාම්බිහා රයිස් මිල්ස් ජේ (පීවීටී) එල්ටීඩී

අධ්‍යක්ෂ මණ්ඩලය අණ පරිදි,

මැනේජ්මන්ට් ඇන්ඩ් බිස්නස් ඇඩ්වයිසර්
සර්විසස් (පීවීටී) එල්ටීඩී
පී වී 259 - සමාගම් ලේකම්වරු.

07-1312

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කිරීම පිළිබඳ දැන්වීම අප විසින් මෙලෙස පළ කෙරේ.

සමාගමෙ නාමය : ඉන්වෙස්ට්ලංකා ඉන්වෙස්ට්මන්ට් කන්සල්ටිං (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 105042
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 47, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස, කොළඹ 07
සංස්ථාගත කළ දිනය : 2015 අප්‍රේල් මස 9 වැනි දින

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස්
(ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

07-1316

---

### සමාගම් නාමය වෙනස්කිරීම සම්බන්ධව කරනු ලබන ප්‍රසිද්ධ දැනුම්දීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගමේ නාමය 2015 ජුනි 17 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි වෙනස් කළ බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ පෙර නාමය : ඩිරෙක්ට් ටෙක්නොලොජිස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ නව නාමය : මුබාෂර් ලෙක්නොලොජිස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 64995
ලියාපදිංචි කාර්යාල ලිපිනය : අංක 19, 6 වැනි මහල, එෆ්. එල්. සී. ගොඩනැගිල්ල, ඩඩ්ලි සේනානායක මාවත, කොළඹ 08

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස්
(ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

07-1317

### ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වගන්තිය ප්‍රකාරව පහත නම් සඳහන් සමාගම සංස්ථාපිත කළ බව මෙයින් දැනුම් දෙමු.

සමාගම් නාමය : එම් ජ් එම් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 106229
ලියාපදිංචි කාර්යාල ලිපිනය : අංක 47, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස, කොළඹ 07
සංස්ථාගත දිනය : 2015.06.11

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් ,
සමාගම් ලේකම්වරු.

07-1318

---

### නිවේදනයයි

පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලද බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර නිවේදනය කරමු.

සමාගමේ නාමය : එම්. ඩී. එම්. ට්‍රැවල්ස් ඇන්ඩ් රෙක්රූට්මන්ට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 87767
ලිපිනය : අංක 6/ඒ/1 සහ 6/ඒ/2, අවිස්සාවේල්ල පාර, ඔරුගොඩවත්ත, කොළඹ 09

ටී. එම්. එච්. එන්. මුනව්වර,
අධ්‍යක්ෂ.

07-1256

---

### නිවේදනයයි

සමාගමේ නම : එජ් මොබයිල් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී. වී. 88368
සමාගම ලියාපදිංචි කළ කාර්යාලය : අංක 37/3, බදුලුපිටිය පාර, බදුල්ල
සමාගම ලියාපදිංචි කළ දිනය : 2012.09.20

07-1285

---

### නිවේදනයයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බව මෙයින් නිවේදනය කර සිටිමු.

සමාගමේ නම : ආර් ඇන්ඩ් ආර් ඩිස්ට්‍රිබියුටර්ස් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී. වී. 92879
සමාගම ලියාපදිංචි කළ කාර්යාලය : අංක 13/14, යමුනා මාවත, කටුගස්තොට
සමාගම ලියාපදිංචි කළ දිනය : 2013.06.05

07-1286

## නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 8 (2) වගන්තිය යටතේ නිවේදනයයි

සමාගමේ නම : ඔෆිස් මාට් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 65529
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : 39/4 ඊ, ඩී. එස්. සේනානායක මාවත, කොළඹ 08
සමාගමේ අලුත් නම : කිස්ට්ලර් මාකටිං සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
නම වෙනස් කළ දිනය : 2010.09.30

සමාගම් ලේකම්වරු.

07-1287

---

## 2007 අංක 7 දරන සමාගම් ලියාපදිංචි කිරීමේ පනතේ 9 (1) වගන්තිය යටතේ නිවේදනය

පහත සඳහන් සමාගම 2014.02.07 වැනි දින 2007 අංක 7 දරන සමාගම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ සංස්ථාපනය කර ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

නම : කැපිටල් රියල් එස්ටේට් (පීවීටී) එල්ටීඩී,
ලියාපදිංචි අංකය : පී වී 96932, ලිපිනය : 9/4, 1/1, කර්නල් ටී. බී. ජයවර්ධන මාවත, කොළඹ 03.

සමාගම් ලේකම්.

07-1290

---

## ඇටර්නි බලය අහෝසි කිරීම

පොතුපිටිය, කත්ලාන අංක 305 පදිංචි පොද්දන කට්ටඩිගේ ගුණරත්න වන මා විසින් වර්ෂ 2014.08.26 දින දී මාතර අධිකරණ කලාපයේ ප්‍රසිද්ධ නොතාරිස් යූ. ජී. එස්. රංජීව ගමගේ මහතා ලියා සහතික කරන ලද අංක 1609 දරන ඇටර්නි බලපත්‍රය මගින් අකුරැස්ස, පෝරඹ පෝරඹවත්ත අංක 209/06 පදිංචි එරික් ජානක හවුපෙ ගමගේ යන අයට දෙන ලද ඇටර්නි බලපත්‍රය මෙයින් අවලංගු කරන බව ශ්‍රී ලංකා ජනරජයටත් පොදු ජනතාවටත් සහ අනෙකුත් සියලු දෙනාටත් මෙයින් දන්වා සිටිමි.

මින් පසු පෙර කී ඇටර්නි බලපත්‍රය මගින් කරන කිසිදු ක්‍රියාවක් සම්බන්ධව මම වගකීම් භාර නොගන්නා බව තවදුරටත් කියා සිටිමි.

07-1329

---

## දැන්වීමයි

පහත විස්තර කරන ලද ව්‍යාපාර නම හා අංක දරන සමාගම 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සංස්ථාගත කරනු ලැබූ සමාගමක් වශයෙන් ලියාපදිංචි කළ ව්‍යාපාරයක් බව දැනුම් දෙමි.

1. සමාගමේ නම : සීගල් රෙසිඩන්සීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
2. සංස්ථාගත කළ දිනය : 2015.02.08
3. සමාගමේ අංකය : පී වී 64058
4. ලියාපදිංචි ලිපිනය : අංක 40 -42, දි ක්‍රෙස්ටර් පෙදෙස, කොළඹ 04.

එකවුන්ටිං ඇන්ඩ් ඇලයිඩ් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්.

අංක 67 ඒ, ඩේවිඩ්සන් පාර,
කොළඹ 04.

07-1337

---

## දැන්වීමයි

පහත විස්තර කරන ලද ව්‍යාපාර නම හා අංක දරන සමාගම 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සංස්ථාගත කරනු ලැබූ සමාගමක් වශයෙන් ලියාපදිංචි කළ ව්‍යාපාරයක් බව දැනුම් දෙමි.

1. සමාගමේ නම : බයෝටා ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
2. සංස්ථාගත කළ දිනය : 2008.02.21
3. සමාගමේ අංකය : පී වී 63135
4. ලියාපදිංචි ලිපිනය : අංක 2 - 3/1, ඇඩම්ස් ඇවනිව්, කොළඹ 04.

එකවුන්ටිං ඇන්ඩ් ඇලයිඩ් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්.

අංක 67 ඒ, ඩේවිඩ්සන් පාර,
කොළඹ 04.

07-1338

---

## දැන්වීමයි

පහත විස්තර කරන ලද ව්‍යාපාර නම හා අංක දරන සමාගම 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ සංස්ථාගත කරනු ලැබූ සමාගමක් වශයෙන් ලියාපදිංචි කළ ව්‍යාපාරයක් බව දැනුම් දෙමි.

1. සමාගමේ නම : පෙන්ට්හවුස් කෙටරර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
2. සංස්ථාගත කළ දිනය : 2008.01.28
3. සමාගමේ අංකය : පී වී 62838
4. ලියාපදිංචි ලිපිනය : අංක 46, උස්වත්ත පාර, දම්පෙ, මඩපාත.

එකවුන්ටිං ඇන්ඩ් ඇලයිට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්.

අංක 67 ඒ, ඩේවිඩ්සන් පාර,
කොළඹ 04.

07-1339

## දැන්වීමයි

අංක 2007 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කිරීම පිළිබඳ දැන්වීම :

සමාගමේ නාමය : අරි සිතුම් සුව සෙත හෙළ ඔසු නිපැයුම් (ගරන්ටි) ලිමිටඩ්

සමාගමේ අංකය : ජීඑල් 2331

ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 194/9/A, සිහින පටුමග, ජාතික තරුණ සේවා මාවත, ඔලබොඩුව, ගෝනපොල හන්දිය, ගෝනපොල.

සංස්ථාගත කළ දිනය : 2015.06.15

චන්දන සිරිවර්ධන,
සමාගම් ලේකම්.

07-1352

---

## දැන්වීමයි

2007 අංක 7 දරන වෙළඳ සමාගම් ආඥපනතේ 9 (1) ඡේදය අනුව පහත සමාගම සංස්ථාගත කළ බව මෙයින් දන්වා සිටිමු :

වෙළඳ සමාගමේ නම : එවර්ග්‍රීන් ඉන්ටර්කොන්ටිනෙන්ටල් (ප්‍රයිවට්) ලිමිටඩ්

ලියාපදිංචි අංකය : පී වී 106679

ලියාපදිංචි කළ දිනය : ජූලි 9, 2015

ලියාපදිංචි කාර්යාලය : අංක 05, ගිල්ෆර්ඩ් ක්රෙසන්ට්, කොළඹ 07.

අධ්‍යක්ෂකවරු.

07-1355

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව මෙම දැන්වීම මෙලෙස පළ කරනු ලැබේ.

සංස්ථාගත කළ සමාගමේ නාමය : සන්තුෂා ට්‍රේඩර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

ලියාපදිංචි අංකය : පී වී 61644

ලියාපදිංචි ලිපිනය : කොළඹ පාර, රන්පුරාව, ගිනිගත්හේන

සංස්ථාගත කළ දිනය : 09.10.07

ගෙස්ට්මන් කෝපරේට් කන්සල්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

අංක 371/2, 1/1, මීගමුව පාර,
වැලිසර.

07-1393

---

## 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය අනුව කරනු ලබන නිවේදනයයි

සංස්ථාගත කළ සමාගමේ නම : අයි. එච්. එන්. ඒ. කෝපරේෂන් (පීවීටී) එල්ටීඩී

ලියාපදිංචි අංකය : පී වී 83443

ලියාපදිංචි ලිපිනය : අංක 05, හිල් කාසල් පෙදෙස, බණ්ඩාරනායක මාවතෙන් හැරී, කොළඹ 12

සංස්ථාගත කළ දිනය : 2011.12.30 වැනි දින.

ලේකම්.

07-1392

---

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, කෑගල්ල, පිටිහුම, බෙලිගස් පාර, අංක 28 පදිංචි රණවීර ආරච්චිල්ලාගේ සෙනවිරත්න (ජාතික හැඳුනුම්පත් අංක 360480496 V) යන ඇටෝර්නි අධිපති වන ම විසින් 2014.07.16 වැනි දින කෑගල්ලේ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ආර්. පී. ජයසේන ලියා සහතික කල අංක 9507 දරන ඇටෝර්නි බලපත්‍රයෙන් කෑගල්ල, රොක්හිල්, අංක 4 හි පදිංචි (ජාතික හැඳුනුම්පත් අංක 763661083 V) උඩවෙල හේවගේ නිරෝධ දිල්රුක්ෂ සිල්වා යන අය මාගේ ඇටෝර්නි බලකරු ලෙසට පත් කරන ලද ඇටෝර්නි බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ඨ කොට අහෝසි කොට අවලංගු කළ බැව් ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

තවද, ඉහත කී උඩවෙල හේවගේ නිරෝධ දිල්රුක්ෂ සිල්වා යන අය විසින් මින් ඉදිරියට මාගේ ඇටෝර්නි බලකරු වශයෙන් කරනු ලබන කිසිම ගණුදෙණුවකට හෝ ක්‍රියාවකට මා වග නොකියන බව ද තවදුරටත් දන්වා සිටිමි.

රණවීර ආරච්චිල්ලාගේ සෙනවිරත්න,
ඇටෝර්නි අධිපති.

07-1405

---

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

හෝමාගම, උඩුවන, අංක 174/2 හි පදිංචි හීල්ලෙ ලියන ආරච්චිගේ රංග කෝසල අබේවර්ධන (ජා. හැ. අංක 821591848 V) වන මම ප්‍රසිද්ධ නොතාරිස් දයන්ත එන්. හේවාවිතාරණ සහතික කළ අංක 368 සහ 2007 ජනවාරි මස 08 වැනි දින දරන ඇටර්නි බලය මගින් හෝමාගම, උඩුවන අංක 174/2 හි පදිංචි හීල්ලෙ ලියන ආරච්චිගේ කරුණාසිරි අබේවර්ධන (ජා. හැ. අංක 371663479 V) වෙත පවරන ලද බලය වර්ෂ 2015ක් වූ ජූනි මස 03 වැනි දින සිට අවලංගු කරන ලද බවත් එදිනට පසු ඔහු විසින් කරනු ලබන කිසිදු ක්‍රියාවකට මා වග නොකියන බවත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රජය සහ මහජනතාව වෙත මෙයින් දන්වා සිටිමි.

එච්. එල්. ඒ. ආර්. කේ. අබේවර්ධන.

07-1425

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ දැන්වීමයි.

සමාගමේ නම : නිශාන් ඔටෝමොබයිල් (ප්‍රයිවෙට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පීවී 66123
ලියාපදිංචි දිනය : 2008.11.07
ලියාපදිංචි ලිපිනය : අංක 456, පුත්තලම් පාර, කුරුණෑගල.

අධ්‍යක්ෂක මණ්ඩලය.

07-1428

---

### ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

අංක 164, ජම්බුගස්මුල්ල මාවත, නුගේගොඩ පදිංචි රොබෙල්ගේ ශානිකා ඉෂානි ලෙනෝරා වන මා වර්ෂ 2006 මැයි මස 23 වැනි දින ආර්. චම්පාද සොයිසා නීතිඥ තැන විසින් සහතික කරන ලද අංක 1702 දරන බලපත්‍රය මගින් අංක 15, පැරකුම් මාවත, බොරුපන, රත්මලාන පදිංචි දෝන මාලිනී ලේකම්ගේ යන අයට දී තිබුණ ඉහත සඳහන් කරන ලද ඇටර්නි බලපත්‍රය වර්ෂ 2015 ජුනි මස 15 වැනි දින සිට බලපවත්වන පරිදි මෙයින් අවලංගු කරන බවට සියලු මහජනයාට දැනුම් දෙනු ලබන අතර මෙදිනෙන් පසු එකී ඇටර්නි බලකාරිය විසින් මා වෙනුවෙන් සිදු කරනු ලබන කිසිම ක්‍රියාවකට මා වග නොකියන බවට මෙයින් ප්‍රකාශ කර සිටිමි.

07-1478

---

### නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර මෙසේ ප්‍රසිද්ධ නිවේදනය කරනු ලැබේ.

නම : ෆෝර් ඇක්සිස් සොලුෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සංස්ථාගත කිරීමේ දිනය : 2012.09.10
ලියාපදිංචි අංකය : පී වී 88160
ලියාපදිංචි කාර්යාලය : අංක 28/3, බෙල්ලන්විල පාර, දිවුල්පිටිය, බොරලැස්ගමුව.

07-1488

---

### නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ නිවේදනයයි

සමාගමේ නම : ශානු ෆවුන්ඩේෂන් ෆෝ හියුමනිටේරියන් ඇසිස්ටන්ස්
සමාගමේ අංකය : ජී ඒ 3050
සමාගම ලියාපදිංචි කාර්යාලය : අංක 146, මලයාලපුරම් නෝර්ත්, කිලිනොච්චි
සංස්ථාගත කිරීමේ දිනය : 2015.07.07

බ්‍රිරිලියන්ට් ප්‍රොමෝටර්ස් ඇන්ඩ් කන්සල්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලියාපදිංචි ලේකම්වරු.

07-1513/1

---

### නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ නිවේදනයයි

සමාගමේ නම : කළම්බු චේම්බර් ඔෆ් කොමර්ස්
සමාගමේ අංකය : ජී ඒ 3051
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : C/o, FCCISL, 467 - 1/1, සිරිමාවෝ බණ්ඩාරනායක මාවත, කොළඹ 14
සංස්ථාගත කිරීමේ දිනය : 2015.07.13

බ්‍රිරිලියන්ට් ප්‍රොමෝටර්ස් ඇන්ඩ් කන්සල්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලියාපදිංචි ලේකම්වරු.

07-1513/2

---

### නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ නිවේදනයයි

සමාගමේ නම : ශක්ති ටෙයිලරිං කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 106820
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : ආලියවල, දලයඩි
සංස්ථාගත කිරීමේ දිනය : 2015.07.07

බ්‍රිරිලියන්ට් ප්‍රොමෝටර්ස් ඇන්ඩ් කන්සල්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලියාපදිංචි ලේකම්වරු.

07-1513/3

---

### නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ නිවේදනයයි

සමාගමේ නම : අබර්නා ටෙයිලරිං කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 106841
සමාගම ලියාපදිංචි කාර්යාලය : වත්තිරායන් නෝර්ත්, දලයඩි
සංස්ථාගත කිරීමේ දිනය : 2015.07.08

බ්‍රිරිලියන්ට් ප්‍රොමෝටර්ස් ඇන්ඩ් කන්සල්ටන්ට්ස්
(ප්‍රයිවට්) ලිමිටඩ්,
ලියාපදිංචි ලේකම්වරු.

07-1513/4

---

### නිවේදනයයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ නිවේදනයයි

සමාගමේ නම : ඔෆිස් මාට් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : PV 65529
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : කිරිමැට්ටෙවත්ත, ගොඩගම, මීගොඩ
සංස්ථාගත කිරීමේ දිනය : 2008.09.20

සමාගම් ලේකම්වරු.

07-1513/5

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය ප්‍රකාරව දැනුම් දෙනු ලැබේ.

සමාගමේ පූර්ව නාමය : ෆෙයාජෙම්ස් ට්‍රේනිං සෙන්ටර් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 73456
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අස්සල උද්‍යානය, අංක 40, ගනේඅරම්බ,මස්සල, බේරුවල
සමාගමේ නව නාමය : ඒ එෆ් ටී ජී වන් (ප්‍රයිවට්) ලිමිටඩ්
පූර්ව නාමය වෙනස් වූ දිනය : 2015 ජූනි මස 22 වැනි දින

සමාගමේ පූර්ව නාමය : ඇසට් එයා වේව්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පීවී 74707
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 196 ස්ටැන්ලි තිලකරත්න මාවත, නුගේගොඩ
සමාගමේ නව නාමය : ට්‍රින්කෝ මැරයින් ඇන්ඩ් ස්ලිප්වේ සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
පූර්ව නාමය වෙනස් වූ දිනය : 2013 අගෝස්තු මස 21 වැනි දින.

ආර්. කේ. එල්. එස්. කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

07-1528

---

## සමාගමක් සංස්ථාපනය කළ බවට දැනුම්දීම

2007 අංක 7 දරන සමාගම් ආඥපනතේ පස්වන වගන්තියට අනුව පහත සඳහන් සමාගම ලියාපදිංචි කර ඇති බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, මහජනතාව වෙතටත් මෙසේ දැනුම් දෙමි.

සමාගමේ නම : ඩී. ඇන්. ඩී. සෙලියුලර් වර්ල්ඩ් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලිපිනය : 21/1, පාසල අසල, ඔබ්බේගොඩ
ලියාපදිංචි අංකය : පී වී 106800
ලියාපදිංචි කළ දිනය : 2015.07.07

ආර්. එම්. එන්. එස්. රත්නායක,
සමාගමේ ලේකම්.

07-1531

---

## විශේෂ ඇටෝර්නි බලපත්‍රයක් ප්‍රත්‍යාදිෂ්ට කිරීම

ස්විට්සර්ලන්තයේ, ග්ලැට්බර්ග් හි, මූලකර් STR - 23 8152 හි පදිංචි විනගායමූර්ති වතෙලිංගම් වන මා විසින් වල්ලිසෙල්ලන්, සැන්ඩ්‍රෝ බූවර් ප්‍රසිද්ධ නොතාරිස් විසින් සහතික කරන ලදුව ශ්‍රී ලංකාවේ, යාපනයේ, වුන්ඩ්කුලිහි, කොලොම්බුගම් පාරේ, අංක 28 ස්ථානයෙහි පොන්නුදුරේ බාලක්‍රිෂණන් වෙත ලබාදෙන ලද 2013 මැයි 10 වැනි දින දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කරමි.

විනගායමූර්ති වතෙලිංගම්.

07-1514

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

හෙයියන්තුඩුව, ඔබවත්ත, අංක 891සී 7/1 දරන ස්ථානයේ පදිංචි, ජාතික හැඳුනුම්පත් අංක 760691623 වී හිමි, එදිරිසිංහ ආරච්චිගේ ඉන්දික ප්‍රසන්න එදිරිසිංහ වන මා විසින් හෙයියන්තුඩුව, ඔබවත්ත අංක 891/සී 7 හි පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 536100067 වී හිමි, වහකුල ආරච්චිගේ අශෝකා ඉන්ද්‍රලතා යන අය වෙත ඇටෝර්නි බලය ප්‍රදානය කළ, එම්. ජයසිරි කොඩිතුවක්කු ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් ලියා සහතික කළ අංක 544 හා 2010.03.13 දිනැති ඇටෝර්නි බලපත්‍රය මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨකොට, අහෝසිකොට අවලංගු කරන ලද බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජ ආණ්ඩුවට සහ ජනතාව වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

තවද, මින් ඉදිරියට එකී අංක 544 දරන ඇටෝර්නි බලපත්‍රය භාවිතා කරමින් කරනු ලබන කිසිදු ක්‍රියාවක් සඳහා මාගේ වගකීමක් නොමැති බව ද මෙයින් දැනුම් දෙනු ලැබේ.

එදිරිසිංහ ආරච්චිගේ ඉන්දික ප්‍රසන්න එදිරිසිංහ.

2015 මාර්තු මස 07 වැනි දින.

07-1435

---

## සීමිත වගකීම් සහිත සමාගමක් සංස්ථාපනය කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව දැනුම් දෙමු.

සමාගමේ නාමය : බ්ලූ මවුන්ටන් අපාට්මන්ට්ස් කළඹු ෆෝ (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 106567, 2015.06.25 වැනි දිනැති
සමාගමේ ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 86, කිරුළපන ඇවනියු, කොළඹ 05.

බිස්නස් මේට් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරුන්.

අංක 45,
බ්‍රේබෲක් වීදිය,
කොළඹ 02.

07-1551

---

## සීමිත වගකීම් සහිත සමාගමක් සංස්ථාපනය කිරීම පිළිබඳ ප්‍රසිද්ධ දැන්වීම

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව දැනුම් දෙමු.

සමාගමේ නාමය : සෝමර් වෙයා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 106777, 2015.07.07 වැනි දිනැති
සමාගමේ ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 5, චාල්ස් පෙදෙස, කොළඹ 03

බිස්නස් මේට් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරුන්.

2015 ජූලි මස 13 වැනි දින,
අංක 45,
බ්‍රේබෲක් වීදිය,
කොළඹ 02.

07-1552

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව පහත නම් සඳහන් සමාගම සංස්ථාපිත කළ බව මෙයින් දැනුම් දෙමු.

සමාගමේ නාමය : ඇන් හෙලනියස් හෝල්ඩිං (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 106466
ලියාපදිංචි කාර්යාල ලිපිනය : අංක 106 (පී. මල්ලිකා) සිංහපුර, උල්ල, ආරුගම්බෙයි, පොතුවිල්
සංස්ථාගත කළ දිනය : 2015 ජූනි 19 වැනි දින

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

07-1562

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව පහත නම් සඳහන් සමාගම සංස්ථාපිත කළ බව මෙයින් දැනුම් දෙමු.

සමාගමේ නාමය : ඉන්ෆිනිටි (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 106474
ලියාපදිංචි කාර්යාල ලිපිනය : අංක 47, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස, කොළඹ 07
සංස්ථාගත කළ දිනය : 2015 ජූනි 19 වැනි දින

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

07-1563

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

### මහජන බැංකුව
(විශේෂ වත්කම් ඒකකය)

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතෙහි 29 ''ඇ'' වගන්තිය යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරළයේ පල්ලේ පත්තුවේ දෙහිවල ගල්කිස්ස මහ නගර සභා සීමාව තුළ අංක 24 නාගරික කොට්ඨාසයේ රත්මලාන උතුරු පිරිවෙන පාරේ පිහිටියා වූ ද වරිපනම් අංක 125/1 හෝ 1/6 ''රත්මලාන එස්ටේට්'' පිරිවෙන පාර, ටෙම්පල් ටෙරස් යැයි කියනු ලබන ඉඩමේ බලයලත් මිනින්දෝරු එච්. අනිල් පීරිස් විසින් සාදන ලද අංක 1911 සහ 1978.08.05 දින දරන පිඹුරේ ලොට් අංක ''Z28A'' යනුවෙන් ලකුණු කොට නිරූපණය කර ඇත්තා වූ ද එකී අංක 1911 දරන පිඹුරට අනුව, පර්චස් 20.69 (අක්කර 0 රූඩ් 0 පර්චස් 20.69) ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ ඊට අදාළ ප්‍රවේශන මාර්ග (අඩි 10ක් පළල) ඇතුව ඉඩම තුළ පිහිටි සියලුම දේ වේ. ඉඩම ලියාපදිංචිය එම් 2083/44 කොළඹ ඉඩම් ලියාපදිංචි කාර්යාලය.

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ 2015 අගෝස්තු මස 21 වැනි දින (සිකුරාද) පෙ. ව. 11.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වැඩි විස්තර සඳහා *රජයේ ගැසට් පත්‍රයේ* 2014.03.21 වැනි දින ද, ඩේලි නිවුස් හා දිනමිණ පුවත්පත්වල ද 2008.05.08 වැනි දින ද, පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.* - කොළඹ කොටුවේ සිට රත්මලාන පිරිවෙන පාර දක්වා කි. මී. 13ක් පමණ ගමන් කර, වම් පසට හැරී පිරිවෙන පාර දිගේ තවත් කි. මී. 1ක් පමණ ගියවිට ටෙම්පලර් ටෙරස්හි අංක 125 දරන පරිශ්‍රය අසලින් වමට ඇති අඩි 10ක් පළල පාරේ අවසානයේ අදාළ දේපළ පිහිටා ඇත.

මෙම ප්‍රවේශය සීමාවකින් තොරව නීත්‍යානුකූලව මෝටර් වාහන වලට යාමට හැකි බව මම මෙයින් සහතික කරමි. කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කුමුදුනි සුජාතා ජාගොඩ විසින් සහතික කරන ලද 1995 ජූලි මස 14 වැනි දිනැති අංක 166 දරන උකස්කරය හා කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඥනා ඒකනායක විසින් සහතික කරන ලද 1998 ජූනි 10 දිනැති අංක 2470 සහ 2000.12.14 දිනැති අංක 3386 දරන උකස් කර වල ප්‍රකාර, තුවාන් මොහොමඩ් සුපි කාසිම් විසින් යුනිපැක් (පුද්ගලික) සමාගම වෙනුවෙන් උකස් කරන ලදුව පොරොන්දු ප්‍රකාරව කටයුතු නොකරන ලද ණය මුදල්.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය :-

1. ගැණුම් මිලෙන් 10%ක් ද, (සියයට දහයක්),
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%ක් ද, (සියයට එකයි),
3. වෙන්දේසිකරුගේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2%ක් ද, (සියයට දෙකහමාර),
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 1,000ක් ද,
5. විකුණුම් වියදම සමග වෙනත් ගාස්තු ඇතොත් එම මුදල ද,
6. විකුණුම් සහතිකය හා මුද්දර ගාස්තු ද.

ගැණුම් මිලෙන් ඉතිරි 90%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත, ප්‍රධාන කළමණාකරු (අයකිරීම්) මහජන බැංකුව, (විශේෂ වත්කම් ඒකකය) ප්‍රධාන කාර්යාලය, පළමු මහල, අංක 75, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02.

දුරකථන අංක : 011 2481546/2481382,
ෆැක්ස් අංකය : 2431033.

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාළ විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක. ඉහත සඳහන් කරන ලද මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මුදලෙන් 10% ක මුදල ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

''ඉහත වෙන්දේසිය, පෙර දැනුම් දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.''

කාර්යාලය : අංක 11/55, කුඩාබුත්ගමුව, අංගොඩ,
දුරකථන අංක : 011 - 5756356/072-3836742.

ඊ. එස්. රාමනායක,
උසාවි කොමසාරිස්,
බලයලත් වෙන්දේසිකරු සහ
තක්සේරුකරු, සාම විනිසුරු, (මුළු දිවයිනටම)

07-1542

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

එම්. ආර්. බදූර්දීන්
ගිණුම් අංක : 0029 5001 4655

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2013.06.30 වැනි දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව, රුපියල් එක් කෝටි හතලිස් හත් ලක්ෂ අසූ පන් දහස් දෙසිය හැත්තෑ එකයි ශත පනස් නවයක (රු. 14,785,271.59) මුදල ද, 2013 මැයි 18 වැනි දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් එක් කෝටි තිස්හතර ලක්ෂ අසූ පන් දහස් නමසිය හැට දෙකයි ශත විසි නවයක (රු. 13,485,962.29) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ හතරක් (14%) බැගින් වූ පොලියද, දුන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදුවූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදුවූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2013.08.08 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ* 2013.07.31 වැනි දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්තිපත්‍රවල පළකොට ඇති පරිදි 2015.09.03 වැනි දින පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන ෂොක්මන් සහ සමරවික්‍රම යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ පල්ලේ පත්තුවේ දෙහිවල - ගල්කිස්ස මහ නගර සභා සීමාවන් තුළ කලුබෝවිල ජයා මාවත හි පිහිටි (කළින් කළුබෝවිල පන්සල පාර, වරිපනම් අංක 59/3), කලුබෝවිල පන්සල පාර, වරිපනම් අංක 45 9/බී/1 දරන ''කොටුවේකුඹුර, කදුරුගහවත්ත, කදුරුගහකුඹුර, පට්ටියේවත්ත, කොළඉන්නේවත්ත, මීගහවත්ත, පාවුලාඹිට්ට, මීගහවත්ත, මාදංගහවත්ත සහ මාදංගහකුඹුර'' යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩී. ජේ. ද සිල්වා යන අය විසින් සාදන ලද (1992 නොවැම්බර් මස 16 වැනි දින සත්‍ය පිටපතක් වශයෙන් සහතික කළ) 1986 මැයි 28 දතම හා අංක 2018 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදවෙන් කොට ලොට් 3A 1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට: අංක 929 දරන පිඹුරේ ලොට් 6 සහ ලොට් 3A 2 නැගෙනහිරට : අංක 586 දරන පිඹුරේ ලොට් 4, ලොට් 5 B සහ 3A 2 සහ අංක 586 දරන පිඹුරේ ලොට් 6, දකුණට : අංක 929 දරන පිඹුරේ ලොට් 3 B සහ ලොට් 3A 2 සහ බස්නාහිරට : අඩි 10 පළල පාර (අංක 929 දරන පිඹුරේ ලොට් 11) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහ අටයි දශම නවයයි එකක් (අ. 0 රූ. 0 පර්. 18.91) විශාල ඉඩම් කොටස සමග පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සහ සියලුම මාර්ග අයිතීන් ද, වෙනත් අයිතීන් ද, වරප්‍රසාදයන්, ප්‍රවශතාවයන්, පරවශ්‍යතාවයන් සහ ඒ හා සම්බන්ධ අනුබද්ධයන් ද සමග එකී අංක 2018 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව M 3332/30 යටතේ දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

පහත සඳහන් දෑ දිගේ හා ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමගය.

බලයලත් මානක තැන එස්. ජෙගතීසන් යන අය විසින් සාදන ලද 1974 නොවැම්බර් මස 24 දතම හා අංක 1965 දරන පිඹුරේ නිරූපිත ලොට් 11 සහ දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව M 1711/248 යටතේ ලියාපදිංචි කොට ඇත.

අංක 2018 දරන එකී පිඹුරේ නිරූපිත ලොට් 5 B දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව එම් 1525/82 යටතේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමූහ සමාගම් ලේකම්.

07-1525

---

**සෙලාන් බැංකුව පීඑල්සී - පානදුර ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ විකිණීම

මෙම දේපළ, වාද්දුව පදිංචි හෙට්ටි කංකානම්ගේ මහීපාල පෙරේරා සහ හෙට්ටි කංකානම්ගේ කීර්තිපාල පෙරේරා යන අය බන්ධනදයි වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, මුනවත්තබාගේ පත්තුවේ රයිගම් කෝරළේ පරගස්තොට පිහිටි බලයලත් මිනින්දෝරු ඒ. එම්. ආර්. ජයසේකර විසින් සාදන ලද 1998.02.02 දිනැති අංක 347 දරන සැලැස්මේ පෙන්නුම් කරනු ලබන දූන් කැබලි අංක බී වශයෙන් ලකුණු කළ ගොන්නගහවත්ත කොටසක් හෙවත් පුවක්වත්ත නමැති අක්කර එකක් (අක්. 1 රූ. 0 පර්. 0) විශාල ඉඩම.

ඉහත සඳහන් දේපළ 2015 අගෝස්තු මස 25 වැනි දින පෙ. ව. 11.00 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.* - මොරන්තුඩුව සිට මිල්ලනිය පාරේ කි. මී. 2.5ක් ගිය විට ඇති පරගස්තොට හන්දියෙන් තවත් මීටර් 100ක් ඉදිරියට ගිය විට හමුවන වම්පස ඇති බොරළු දැමූ ප්‍රාදේශීය සභා පාරෙන් මීටර් 300ක් ඉදිරියට ගිය විට, දකුණු පස ඇති අඩි 20ක් පළල පාර සැලැස්මේ පෙන්නුම් කරන පරිදි ඉඩමට යෑම සඳහා ඇති මාර්ගය වේ.

යෝජනා සම්මුති දැන්වීම. - *රජයේ ගැසට් පත්‍රයේ* 2006.06.09 වැනි දින ද ලංකාදීප සහ ඩේලිමිරර් යන පුවත්පත්වල 2006.04.27 වැනි දින ද, වීරකේසරී පුවත්පතේ 2006.05.11 වැනි දින ද පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පලාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1%(සියයට එකක්) වන පළාත් අධිකාරී බද්ද සහ ඒ වෙනුවට රජයෙන් හෝ පළාත් අධිකාරියෙන් පනවනු ලබන වෙනත් ඕනෑම බද්දක්. 3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 500, 6. සියලුම ප්‍රචාරක වියදම්, ගැණුම් මිලෙන් ඉතිරි 90% විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවා නිමකළ යුතු ය.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% ක මුදල් ආපසු නොගෙවීම සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. ප්‍රධාන කළමනාකාරිණිය (නීති) සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03. දුරකථන අංක 011 - 2456473, 2456480.

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී. ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත, කොලොන්නාව.
දුරකථන අංක 011 3068185, 011 - 2572940.

07-1518

---

## ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

(1) ණය යොමු අංකය 74133382.

මහේෂ් ප්‍රසන්න පින්දෙනිය මහතා සහ මාදම්පහේ දෙන් දුල්ශ්‍රියානි මාදම්පගේ මහත්මිය යන අයට අයත් උකස්කරන ලද දේපළ විකිණීම

(2) ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2015.06.12 දිනැති අංක 1919 දරන ගැසට් පත්‍රයේ හා 2015 ජූනි 10 වැනි බදාදා දිනැති ''ඩේලි නිව්ස්', දිනමිණ හා තිනකරන්'' යන පුවත්පත් වල පළ කරන ලද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුකූලව මුල් ණය මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥාපනතේ අංක 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍ර එකී ස්ථානයේ දී ම 2015.08.20 වැනි දින පෙ. ව. 11.00 ට කොළඹ 05, හැව්ලොක් පාරේ, අංක 290 හි පදිංචි වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහත්වරුන් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

### උකස් බැඳුම්කරයෙහි සඳහන් උපලේඛනය

1. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරලේ ගඟබඩ පත්තුවේ 410/CA වසර ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, කිරිදිවැල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දෙම්පෙ ප්‍රාදේශීය සභා සීමාව තුළ ලුණුගම පිහිටි රදවලලන්ද නමැති ඉඩමට එහි ඇති ගහකොළ, ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ ද ඇතුළත්ව බලයලත් මිනින්දෝරු කේ. ටී. පී. ආර්. අහුගම්මන විසින් සාදන ලද 1999 අප්‍රේල් මස 01 දිනැති අංක 91A/1999 දරන පිඹුරෙහි ලොට් 4 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 4 උතුරට : ප්‍රාදේශීය සභා පාර ද, නැගෙනහිරට : ලොට් 5 ද, දකුණට : ලොට් 6 ද, බස්නාහිරට : ලොට් 3 ද, මායිම්ව අංක 91A/1999 දරන පිඹුරට අනුව පර්චස් දහසයක (අ. 0 රූ. 0 පර්. 16) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G 144/104 හි ලියාපදිංචි කර ඇත.

2. එකී ලුනුගම පිහිටි ''රදවලලන්ද'' නමැති ඉඩමේ, එහි ඇති ගහකොළ ගොඩනැගිල්ල සහ වෙනත් සියලු දේ ඇතුළත්ව අංක 91A/1999 දරන පිඹුරෙහි ලොට් 5 ලෙස දක්වා සීමා නිර්ණය කොට ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 5 උතුරට : ප්‍රාදේශීය සභා පාර ද, නැගෙනහිරට: පිඹුරු අංක 775 හි ලොට් A ද, දකුණට : ලොට් 6 ද, බස්නාහිරට : ලොට් 4 ද, මායිම්ව එකී අංක 91A/1999 දරන පිඹුරට අනුව පර්චස් දහසයකින් (අ. 0 රූ. 0 පර්. 16) යුක්ත වන අතර මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී 128/21 හි ලියාපදිංචි කර ඇත.

මේ සමග මෙය අංක 91A/1999 දරන පිඹුරෙහි ලොට් 3 ලෙස දක්වා ඇති පාරට වෙන් කළ කොටස මතින් හා ඒ දිගට මාර්ග අයිතිය ද ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

පී. කේ. එන්. පන්ඩුවාවල,
කළමනාකාරිණී.

ලංකා බැංකුව,
හංවැල්ල.

07-1406

## ප්‍රසිද්ධ වෙන්දේසියක්

කොළඹ පැවැත්වෙන බස්නාහිර පළාතේ පළාත් (සිවිල්) මහාධිකරණයේ දී ය.

කොළඹ 01, අංක 21 බ්‍රිස්ටල් වීදියේ හි පිහිටා ඇති ''කොමර්ෂල් හවුස්'' සහ කොළඹ 12 පරණ යෝන් වීදියේ අංක 442/ඒ දරන ස්ථානයේ හි ශාඛා කාර්යාලයක් පිහිටා ඇති කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්

.............................පැමිණිලිකරු.

නඩු අංක 299/2007/එම්. ආර්.

(1) රාජසිංහම් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ් අංක 105, මැසෙන්ජර් වීදිය, කොළඹ 12 සහ අංක 247, ගාලු පාර, කොළඹ 04 සහ අංක 190 සී, ඉහළ යාගොඩ, ගම්පහ.

(2) මුත්තයියා විලියම්ස් රාජසිංහම්, මුත්තයියා විලියම් රාජසිංහම් යනුවෙන් ද හදුන්වනු ලැබේ.

(3) ජෝර්ජන් රාජකුමාර් රාජසිංහම්

(4) ආරුනන් නිරංජන් රාජසිංහම්

(5) දීපන් ප්‍රේමකුමාර් රාජසිංහම් සියලු දෙනාම අංක 63, ඩේවිඩ්සන් පාර, කොළඹ 04 සහ අංක 63, ඩේවිඩ්සන් පාර, කොළඹ 04 සහ අංක 190 සී, ඉහළයාගොඩ, ගම්පහ.

........................විත්තිකරුවන්.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ මුදුන්ගොඩ ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත මැද පත්තුවේ සියනෑ කෝරළේ ඉහළ යාගොඩ ග්‍රාමයෙහි පිහිටා ඇත්තා වූ ද උතුරින් ගම්පහ සිට ඉඹුල්ගොඩ දක්වා මහා පාරෙන් නැගෙනහිරට : බී ඒ පෙරේරා සහ වෙනත් තැනැත්තන් විසින් දැනට හිමිකම් දක්වා ඇති අංක 1222 දරන පිඹුරේ ''සී'' බිම් කැබැල්ලෙන්, දකුණින් කේ චාර්ලිස් අප්පුහාමි විසින් හිමිකම් දක්වා ඇති කුඹුරෙන් හා බස්නාහිරින් සිරිසේන ජයකොඩි විසින් හිමිකම් දක්වා ඇති ඉඩමෙන් දැනට කේ. ඒ. කුසුමාවතී විසින් හිමිකම් දක්වා ඇති අංක 1222 දරන පිඹුරේ ඒ බිම් කැබැල්ලෙන් මායිම් ව ද, ප්‍රමාණයෙන් අක්කර එකයි රූඩ් දෙකයි පර්චස් දහතුනයි දශම පහයි බිංදුවකින් (අ. 01, රූ. 02, පර්චස් 13.50) යුක්ත වූ ද, ''යාගොඩ එස්ටේට්'' යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමෙන් හා එයින් බලයලත් මිනින්දෝරු ජී. සින්නතම්බි මහතා විසින් සාදන ලද අංක 4360 හා 1994 ජනවාරි මස 28 වැනි දින පිඹුරේ නිරූපිත ''බී'' බිම් කැබැල්ල වශයෙන් බෙද වෙන්කරන ලද හා නියමිත මුළු ඉඩම් කැබැල්ල වේ.

**(අ)** පළමුවන නඩු නිමිත්ත මත රු. 200,000 ක මුදලක්, සහ රු. 200,000 ක් වූ ඉතිරි ප්‍රාග්ධන මුදලක් මත 2001 මැයි මස 19 වැනි දින සිට ඒ මුදල සම්පූර්ණයෙන් ගෙවා අවසන් කරනු ලබන තෙක් වර්ෂයකට 30% ක අනුප්‍රමාණයක් අනුව වූ පොළියක් ද, **(ආ)** දෙවන නඩු නිමිත්ත මත රු. 2,610,000 ක මුදලක්, ඒ මුදල මත 2001 පෙබරවාරි මස 01 වැනි දන සිට 2001 ජුනි මස 01 වැනි දින තෙක් වර්ෂයකට 21% ක අනු ප්‍රමාණයක් හා ඉන් පසුව ඒ මුදල සම්පූර්ණයෙන් ගෙවා අවසන් කරන ලබන තෙක් ඒ මුදල මත වර්ෂයකට 30% ක අනුප්‍රමාණයක් අනුව වූ පොළියක් සමග **(ඇ)** තුන්වන නඩු නිමිත්ත මත රු. 3,285,000 ක මුදලක් ඒ මුදල මත 2001 මාර්තු මස 06 වැනි දින සිට 2001 ජූලි මස 06 වැනි දින තෙක් වර්ෂයකට 21% ක අනුප්‍රමාණයක් හා ඉන් පසුව ඒ මුදල සම්පූර්ණයෙන් ගෙවා අවසන් කරනු ලබන තෙක් ඒ මුදල මත වර්ෂයකට 30% ක අනුප්‍රමාණයක අනුව වූ පොළියක් සමග **(ඈ)** හතරව නඩු නිමිත්ත මත රු. 4,000,000 ක මුදලක් සහ ඒ මුදල මත 2001 මාර්තු මස 23 වැනි දින සිට 2001 ජූලි මස 21 වැනි දින තෙක් වර්ෂයකට 21% ක අනුප්‍රමාණයක් හා ඉන් පසුව ඒ මුදල සම්පූර්ණයෙන් ගෙවා අවසන් කරනු ලබන තෙක් ඒ මුදල මත වර්ෂයකට 30% අනුප්‍රමාණයක් අනුව වූ පොළියක් සමග **(ඉ)** පස්වන නඩු නිමිත්ත මත රු. 2,000,000 ක් සහ මුදලක් ඒ මුදල මත 2001 මාර්තු මස 23 වැනි දින සිට 2001 ජූලි මස 21 වැනි දින තෙක් වර්ෂයකට 21% ක අනුප්‍රමාණයක් හා ඉන් පසුව ඒ මුදල සම්පූර්ණයෙන් ගෙවා අවසන් කරනු ලබන තෙක් ඒ මුදල මත වර්ෂයකට 30% ක අනුප්‍රමාණයක් අනුව වූ පොළියක් සමග **(ඊ)** හයවන නඩු නිමිත්ත මත රු. 2,500,000 ක් සහ මුදලක් ඒ මුදල මත 2001 අප්‍රේල් මස 17 වැනි දින සිට 2001 අගෝස්තු මස 15 වැනි දින තෙක් වර්ෂයකට 21% ක අනුප්‍රමාණයක් හා ඉන් පසුව ඒ මුදල සම්පූර්ණයෙන් ගෙවා අවසන් කරනු ලබන තෙක් ඒ මුදල මත වර්ෂයකට 30% ක අනුප්‍රමාණයක් අනුව වූ පොළියක් සමග **(උ)** හත්වන නඩු නිමිත්ත මත රු. 20,000,000 ක් සහ මුදලක්. ඒ මුදල මත 2001 අප්‍රේල් මස 18 වැනි දින සිට 2001 ඔක්තෝබර් මස 15 වැනි දින තෙක් වර්ෂයකට 21% ක අනුප්‍රමාණයක් හා ඉන් පසුව ඒ මුදල සම්පූර්ණයෙන් ගෙවා අවසන් කරනු ලබන තෙක් ඒ මුදල මත වර්ෂයකට 30%ක අනුප්‍රමාණයක් අනුව වූ පොළියක් සමග **(ඌ)** අටවන නඩු නිමිත්ත මත රු. 2,500,000 මුදලක් සහ ඒ මුදල මත 2001 අප්‍රේල් මස 20 වැනි දින සිට 2001 අගෝස්තු මස 18 වැනි දින තෙක් වර්ෂයකට 21% ක අනුප්‍රමාණයක් හා ඉන් පසුව ඒ මුදල සම්පූර්ණයෙන් ගෙවා අවසන් කරනු ලබන තෙක් ඒ මුදල මත වර්ෂයකට 30% ක අනුප්‍රමාණයක් අනුව වූ පොළියක් සමග **(එ)** නමවන නඩු නිමිත්ත මත රු. 2,875,000 මුදලක් සහ ඒ මුදල මත 2001 මැයි මස 11 වැනි දින සිට 2001 සැප්තැම්බර් මස 08 වැනි දින තෙක් වර්ෂයකට 21% ක අනුප්‍රමාණයක් හා ඉන් පසුව ඒ මුදල සම්පූර්ණයෙන් ගෙවා අවසන් කරනු ලබන තෙක් ඒ මුදල මත වර්ෂයකට 30% ක අනුප්‍රමාණයක් අනුව වූ පොළියක් සමග **(ඒ)** දසවන නඩු නිමිත්ත මත රු. 3,000,000 මුදල් සහ ඒ මුදල මත 2001 මැයි මස 17 වැනි දින සිට 2001 සැප්තැම්බර් මස 14 වැනි දින තෙක් වර්ෂයකට 21% ක අනුප්‍රමාණයක් හා ඉන් පසුව ඒ මුදල සම්පූර්ණයෙන් ගෙවා අවසන් කරනු ලබන තෙක් ඒ මුදල මත වර්ෂයකට 30% ක අනුප්‍රමාණයක් අනුව වූ පොළියක් ද නඩු ගාස්තු සහ වෙන්දේසිකරුගේ ගාස්තු ද අයකර ගැනීම පිණිස ඉහත කී විත්තිකරුවන්ට විරුද්ධව ඉහත කී පැමිණිලිකරු විසින් පවරන ලද ඉහත සඳහන් නඩුවෙන් මා වෙත පවරා ඇති බලය මත ඉහත කී දේපළ මා විසින් 2015 ක් වූ සැප්තැම්බර් මස 04 වැනි දින පෙරවරු 11.00 ට කණිසමට අදළ දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට ප්‍රවිශ්ඨ වන මාර්ගය.* - කොළඹ සිට මහනුවර දක්වා දිවෙන මාර්ගය ඔස්සේ ඉඹුල්ගොඩ මංසන්දිය දක්වා කි. මී. 24 කණුව දක්වා ගමන් කොට වමට හැරී ඉඹුල්ගොඩ ගම්පහ මාර්ගයේ කි. මී. 1.5ක් පමණ ගමන් කිරීමෙන් මෙම මාර්ගයේ වම් පසින් මෙම දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැනුම්කරු විසින් පහත සඳහන් මුදල් ඒ අවස්ථාවේම වෙන්දේසිකරුට ගෙවිය යුතු ය :-

(1) ගැණුම් මිලෙන් 25%ක් ද, (2) පලාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ක් ද, (3) වෙන්දේසිකරුගේ වෘත්තීය ගාස්තු වශයෙන් ද 2.5%ක් ද, (4) වෙන්දේසිය සඳහා දරන්නට වූ සියලුම වියදම් ද, (5) සෝෂක හා ලිපිකරු ගාස්තු වශයෙන් රු. 2,500 ක මුදලක් ද, (6) වෙන්දේසි කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු වශයෙන් රු. 7,500 ක මුදලක් ද වන අතර ගැණුම් මිලේ පරිශේෂය වන 75% ක මුදල වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ගරු අධිකරණයේ මෙම නඩුවේ බැරට තැන්පත් කළ යුතු ය.

වැඩි විස්තර සඳහා කොළඹ 01, ජනාධිපති මාවතේ අංක 41 දරන ස්ථානයේ නීතිඥවරුන් හා නොතාරිස්වරුන් වන ජූලියස් ඇන්ඩ් ක්‍රීසි සමාගමෙන් විමසන්න. දුරකථන අංක 011 2422601 - දිගුව 408.

පී. කේ. ඊ. සේනාපති,  
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා  
වරලත් වෙන්දේසිකරු.

අංක 134, බැද්දගාන පාර,  
කෝට්ටේ.  
දුරකථන අංක : 011 28736565, 0777 672082 ෆැක්ස් අංකය : 011 2871184.

07-1511

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.